

# වෙසක් කූඩුව

*අඳුර වැටුන පසු අපි ඉටිපන්දමක් පත්තුකර කූඩුවේ තැබීමු. කූඩා කල මා කූඩු දල්වන විට විඳි සන්තෝසයම මගේ පුතුගේ මුහුනේ නොතිබුනත් ඔහු කුතුහලයෙන් බලා සිටියේ ය. විදුලි පහන් නිවා ඒ දෙස බැලීමු. මා සිතින් මවාගත් පරිදි සුලගේ නැලැවෙන වෙසක් සඳ එලියේ නැහැවෙන කූඩුවක් නොවේ එය. ලංකාවේ මෙන් සුළඟට නැලවෙන වරල් වලින් යුත් කූඩුව ඔහේ එල්ලී උන්නා ය.*

**වෙසක්** කූඩුවක් පුතුට දිය යුතු යැයි මට සිතුනේ එකවරටම ය. පෙරදා රාත්‍රියේ නිවසට පැමිණි මිතුරියක් අගේ පුතුට වෙසක් කූඩුවක් තනනා බව කිවා ය. පසුගිය වෙසක් පොහෙ-ාය ලංකාවේ ගත කල ඒ සිගිත්තා විඳි සතුට ගැන මව අපට කිවා ය. ඒත් මටත් මගේ පුතාට කූඩුවක් සාදා දිය යුතු යැයි සිතුනේ වැඩ පලේ උදෑසන තේ විවේකයේ දී ය. ඊට ඇගේ කතාවත්, මා පාන්දර ගෙදරින් එලියට බසිනා විටත් ඈත අහසේ බැස යමින් තිබූ වෙසක් සඳත් එක සේ හේතු වන්නට ඇත. එතැන් පටන් වැඩ අතරේ මා සිටියේ හදන්නට යන වෙසක් කූඩුව ගැනත් අතීතයේ ගෙවූ මිහිරි වෙසක් මතක අතරත් පාවෙමිනි.

මා ඒ සතුට මගේ පුතුටත් ලබා දිය යුතු ය. සිරි සිරි හඬෙන් සැලෙනා වෙසක් කූඩු වල වරල් සුලගේ හමා විත් මුහුනේ වදිනා විට දැනුනු සිහිල් පහස මගේ පුතුටත් ලබා දිය යුතු ය. වෙසක් බලා ඇවිදිමින් යන රෑ කල ගෙවතු වල එල්ලුන බකට් පහන්, අඳුරු ආලින්ද නෙක විද ආලෝකයේ පොගවමින් සැරසී හුන් සැටි. .. හුළගේ නිවෙන්නටම ගොස්, යලි පන ඇදී දැල්වෙන පහන් වැට පෙල ලඟින් යනෙනා විට දැනෙන තෙල් ඈවර වුනු පහන් තිර පට දැවී යන විට නැගෙන කර පුසුඹින් නාසා පිරී යයි. තැනක අඹ ඉත්තක දැවී කර වී සැකිල්ලෙන් පමනක් එල්ලී ඉන්නා කූඩු.. එකත් එකටම සුලගේ දඟ කරමින් අකීකරු වූ වරලක් පහන් වැටියේ පැටලුනා වන්නට ඇත. දන්සැල් වලට වැදී බඩ පුරා කා බී සෙනග අතරේ පැටලෙමින් නිදහසේ ඇවිද ගිය අයුරු කොතරම් චමත්කාර ද? සෙනඟින් පිරී ගිය පන්සල් වත්තෙන් නැගෙන සාදුකාර හඬ හා මුසුවුණ නොනවතින ගාථා හඬ දැනුත් ඇසෙනවා වැනි ය. දැල්වෙන හඳුන් කූරු බඳුනින් නැගෙන හුස්ම කිර කරවන තරම් තද සුවඳ පොල් තෙල් පහනේ ඇගිලි ගාවා තෙල් හිස ගල්වා ගන්නා උපාසක ආත්තම්මා කෙනෙකුගේ කරුනා බර හිනාවක වෙලී නොදැනී යයි. වෙසක් රාත්‍රිය ගැන හිතේ කොයි තරම් දේ හිරවී ඇද් ද?

මේ පලමු මතක ඔහු හා බෙදා ගන්නට පටන් ගත යුතු ය. හේ තවමත් සිවු හැවිරිදි ය. ඔහුට වෙසක් කූඩුවක් තනා දී ඒ ඇසුරෙන් වෙසක් ගැනත් ලංකාවේ ජීවන රටාව ගැනත් කියා දෙන්නට මට පිලිවන. කුඩා කාලයේ පටන් මේ වැනි ලාංකි සංස්කෘතියේ දේ ඇසුරු කිරීම නිසා ඕස්ට්‍රේලියාවේ ඉපදී හැදෙනා ඔහුට අවුරුද්දකට දෙකකට වතාවක් නිවාඩුවට යන ලංකාවේ, ඔහුගේ තාත්තා ගෙවූ ජීවිතය ගැන අවබෝධයක් පසු කලෙක හෝ ලැබෙනු ඇත.

වෙසක් කූඩුවක් සදන්නට හිතුනත් ප්‍රශ්නයකට තිබුනේ මගේ නොදන්නා කමය. තරුන වියට එළඹ හුස්මක් ගන්න ඉඩක් නැති තරමට ටියුෂන් වසංගතයට ගොදුරු වන තෙක්ම අපි අපේ ගෙදර ඉස්සරහ වෙසක් කූඩු එල්ලුවෙමු. වරක් පාරේ විදුලි වයරයට උඩින් යන්නට තරම් උස වූ තරු හතකින් යුතු මහා විසාල නෙලුම් මලක් හැදුවා මට මතකය. අපේ නිවසේ ඉදිරිපස ගේට්ටුවට එපිටින් ඇති රවුම් ඉඩ කඩ මේවාට අපූරුවට ගැලපිනි. මේ මිදුල අපටත් තවත් නිවසකටත් පොදු ඉඩකි. ඒ නිවසේ උන් අපට වඩා අවුරුදු කිහිපයක් වැඩිමල් හින්නි අයියා ත් පද්මසිරි අයියාත් කූඩු සෑදිමේ කෙල පැමිනි දෙනෙකි. අපි කූඩු සාදන්නේ හවුලට ය. ශිල්පය එහා ගෙදරිනි. වියදම අපේ ගෙදරිනි. ශ්‍රමයට පංගු පේරුවක් නැතිව කාගේත් අතහිත ලැබිනි. ඒ අයියලා උන ගසක් ගෙනැවිත් වියලා පදම් කොට මිම්මට කපා සැස රෑ ගානක් නිදි නැතිව කූඩු බඳිති. මාත් මල්ලිත් හැකි පමනින් උදව් දෙමු. දුසිම් ගනන් සවුකොලත් නූල් පන්දුත් නරක් නොවී තියෙන්නට පාප්ප හදනා විට දමන පල්මා-නික්කම් කැටත් නොඅඩුව සපයමු. කොල අලවන විට ගෙවල් දෙකේම ගැහැනු පිරිමි සියල්ලෝ එකතු වෙති. වරල් රැලි දිග ඇරීම නම් හැමදාම ගැහැනුන්ටම පැවරුන වැඩ කි. මිදුලේ කූඩුව එල්ලූ විට එය අප කාගේත් ය. ගෙවල් දෙකේම මිදුල් සඳ එලිය කපා පැතිරෙන වෙසක් කූඩුවේ එලියෙන් සමසේ එලිය වෙයි.

වෙසක් නිවාඩුව ලබන දා අපි කලින් දාටත් වඩා උදෑසනින් නැගිටිමු. කරන්නට වැඩ අනන්තය. කූඩු වල වැඩ ඉවර කරන්නට ඕනෑ ය. දහවල කුස්සියේ කලබලයකි. කොහේ හෝ දන්සැලකට පොරොන්දු වූ බත් පැකට් හෝ කෑම වර්ග හෝ හදන්නට අම්මලා වෙහෙස වෙති. මමත් මල්ලීත් ගෙදරින් ඉතා ළඟ පිහිටි පන්සලේ පවත්වන දන්සැලේ පෝලිමේ මුලින්ම සිටිමු. බඩ පුරා කමු. ඉන් පසු පෝලිමට එකතු වන දන්නා කියන අයට කොලොප්පම් කරමු. හවස කූඩු එල්ලන්නට පටන් ගැනෙයි. නොසිතූ අකරතැබ්බ සිදුවීමට පුලුවන. එක්කෝ කූඩුව ඇල ය. නැතහොත් හදිස්සියේ අතක් වැදී කොලයක් ඉරී යයි. එහෙමත් නැත්නම් ලයිට් දමන කොට ෆියුස් එකක් හෝ දැවී යයි. කූඩු වලට ලයිට් වැල් ඇද ලයිට් දමා පත්තු කරන තුරු අපට ඉවසිල්ලක් නැත. කලුවර වැටෙන තුරු නොඉවසිල්ලෙන් පසුවෙමු. ලයිට් එලියෙන් නැහැවෙන, සුලගේ එල්ලෙන දිගු වරල් මට ගෙන දුන්නේ ඉමහත් ආශ්වාදයකි. අතගා බලන්නටත් මුහුනේ තැවරෙන සේ ඒවා අතරින් යන්නටත් මම මහත් සේ ආහා කලෙමි.

ඇල වූ සවුකොල රබානක් සේ තද ය. තට්ටු කලත් ඉරී යන තරම් ය. ඇඟිල්ලෙන් තට්ටු කල විට බෙරයක් මෙන් මෘදු ගුම් හඬක් නගයි. ඒ තරම් තදේට කොල අලවන්නට අපේම රහසක් තිබුනි. කූඩු අලවා ඉවර වූ පසු අපි අතැඟිලි වතුරෙන් තෙමා පිනි මෙන් සිහින් වතුර බිඳු කූඩුවට ඉසිමු. තෙත් වූ සවුකොල වේලෙන විට ඇකිලෙයි. රාමුවට අලවා ඇති නිසා තද වී ඇදෙයි. වතුර ඉසීම ඉතා පරිස්සමට කල යුතු ය. නැතහොත් කොලය ඒකාකාරීව නොඇකිලී පැල්ලම් හට ගනියි. දෙතුන් වරක් තෙමා වේලුනු පසු ව රබානක් හෝ බෙරයක් තරම් කදිමය. අල්ලපු ගෙදර අයියලා කූඩු තැනීමේ කෙල පැමිනි අය යැයි මා කිවේ එබැවිනි.

සැන්දෑ අඳුර සෙමින් පැතිරෙයි. අප කූඩු එල්ලා බලා සිටින්නේ අඳුර තවත් දැඩි වන තෙක් ය. ලයිට් දමන වේලාව මනමාලියක් පොරුවට නංවන වේලාව වාගේ ය. කාගේත් ඇස් යොමුවී ඇත්තේ එතැනට ය. විදුලි බුබුලු දැල් වූ සැනින් කූඩුව ඒකාලෝක වේ. සව් කඩදාසි අතරෙන් පෙරී බිම වැතිරෙන ඒ එලිය සඳ එලිය මෙන් මෘදු ය. පවනැල්ලේ දඟලන කූඩුවේ රැලි ඒ මන්දාලෝකයේ තෙමෙමින් අප සමග මද සිනා නගනවා වැනි ය. අපි කූඩුව ළඟට ගොස් බලා සිටිමු. දුරට ගොස් බලා සිටිමු. අනෙක් අවුරුදු වල තැනූ කූඩු හා සසඳමු. ලබන අවුරුද්දටත් ප්ලෑන් හදමු. කොයි තරම් බැලුවත් මදි ය. වෙසක් සඳ මෝදුවී එන අඩ අඳුරේ දිදුලන කූඩුව බලා ඉන්නා අපට ඉහේ මල් පිපුනාක් මෙන් සන්තෝසය.

බකට් එල්ලන්නට පටන් ගන්නේ ඇති තරම් කූඩුව රස වින්දාට පසු තවත් කලුවර වූ විට ය. මිදුලේ එහාටත් මෙහාටත් තුන් හතර වාරයක් ලනු වැල් අදිමු. එකක් ඇතුලේ එකක් දමා බම්බු මෙන් අඩුක් කර තැබූ ගිය වසරේ බකට් තාත්තා ගබඩා කාමරෙයන් අරන් එයි. ඒවා කොපමන තිබුනත් මල්ලීත් මමත් අලුත් බකට් දුසිම් දෙක තුනක් තොහොමින් හෝ ගෙන්වා ගනිමු. සීරුවට බකට් එක පහලට නමා ඉටිපන්දම ගසා දල්ලන්නේ තාත්තා ය. අපි ඒවා කම්බියෙන් ලනු පටේ එල්ලමු. පාටින් පාට කලවමට එල්ලන හැටි නියම කරන්නෙ අක්කලා ය. ලනු වැල් පිරුනු පසු ඉතිරි බකට් අපි ගෙවත්තේ මල් ගස් වලත් පඳුරු වලත් එල්ලමු. අම්මා තාප්පය දිගේත් ගේ වටේටත් පොල්තෙල් පහන් දල්වයි. පොල්තෙල් දැවෙනා සුවඳෙනුත් ඉටිපන්දම් දැවෙනා සුවඳෙනුත් අපට වාත පිරී යයි. වෙසක් සඳ ඈත අහසේ පායා අප දෙස බලාගත් වනම හිඳියි. තැනින් තැන මල් ගොමු වල එල්ලූ බකට් මීදුමක දැල්වෙන විදුලි බුබුලු වැනි මද එලියක් විහිදුවයි. ලමයින් වූ අප සඳ



**තුසිත් රවිඳු අබේනායක**

එලියෙනුත් බකට් එලියෙනුත් කූඩුවේ ආලෝකයෙනුත් එකලු වූ මිදුලේ සෙල්ලම් කරමු. සිනා පිරි මුවෙන් අපි සෙල්ලමේ යෙදෙනු අම්මාත් තාත්තාත් අඹ ගස යට බංකුවට වී බලා හිඳිනු මට දැනුදු මැවී පෙනෙයි. අප දිහා බලා ඒ වෙසක් සඳ රැසේ ගිලුනු රාත්‍රි වල කොතරම් සතුටක් ඔවුන් විඳින්නට ඇද්ද? හිටි ගමන් නැගෙන අක්කාගේ ගාලගෝට්ටිය ට හේතුව ඇයට නොදැනෙන සේ ඇගේ කකුලට හෝ අතට මල්ලී ඉටිපන්දම් කිරි බින්දුවක් දැමීම වන්නට ඇත.

පන්සලටත් ඉන් පසු තොරන් බලන්නටත් යන්නේ බකට් වල ඉටිපන්දම් දැවී ඉවර වෙන්නට පටන් ගත්තාමය. වැටෙන් කඩාගත් අරලිය මලින් ද මිදුලේ පඳුරු වලින් නෙලා ගත් විවිධ වර්ගයේ මලින් ද පිරි මල් වට්ටියත් අඳුන්කූරු, පාන්තිර, ආදී අඩුම කුඩුමත් ගෙන අපි පන්සලට යමු. වෙසක් බලන්නට යාමේ ආසාව වැඩිවුනත් පන්සලත් වෙසක් දාට බලන්න බැරි තරම් ලස්සන ය. පන්සල් ගමනත් වෙසක් බලන්නට ඇවිද ගිය ගමනත් මතකයට නගනා මට ඉන් සමහරක් රාත්‍රි වඩාත් සුන්දර යැයි දැන් සිතේ. ඒ නම් අපේ පවුලේ හයදෙනාම එකට එකතු වී බලන්නට ගිය වෙසක් ගමන් ය. ටක්කලා දෙන්නාත් මාත් මල්ලීත් කැටුව අම්මා ත් තාත්තාත් මාතර නගරය වටා හැතැම්ම දෙක තුනක රවුමක් ඇවිද්දාහ. නූපේ හන්දියේ නාට්ටිය බලන්නට යන අපි ටික වේලාවක් එහි රැඳී සිටිමු. අතොරක් නැති තරමට සෙනගය. දිලිහෙන කාබයිට් ලාම්පුව තට්ටුව මැදින් සවිකරගෙන අලියා මූඩ් පියන් තලා සාදාගත් ගෙප්ජි වලල්ල සොලවමින් සාරවිට කාරයන් එලි බසින්නේ මේ කාලයටය. සාරවිට උඩ තිබෙනා පාට කල


# Cool Tint

car window tinting, keep your car cool and look cool
Reliable work
16 years window tinting experience in the industry.
Window tint secure up to 99% UV protection, principle cause of skin cancer.
Reducing the interior temperature in your car.
Window tint also help reduce fading and cracking of the fabric and plastic in the car.

99% UV protection
66% heat reduction
65% glare rejection



**Office 9470 1901**
**Upali 0417 599 620**
**Tony 0402 481 108**

Service area Preston, Dandenong and surrounding suburbs

Mobile tinting also available.